**ශිරෝමා**
මේ වෙලාවෙ හද පිරි සතුටින් මතක් කරන්න ඕනෙ බොහෝ දෙනෙක් මට උදව් කරන්න ඉදිරිපත්වීම ගැන. ගීත ගායනයෙන් කළිඳු වීරසිංහ. සෙව්වන්දිකා අබේරත්න. පුෂ්පා තිසේරා. හේමන්ත ඩයස් සහභාගිවෙනවා. ඒ වගේම නැටුම් අංග වලින් විශ්ව රංගායනයේ රශිකා කුලසිංහත් ජයන්ති ඉලංගකෝන් යන නැටුම් ගුරුවරියන්ගේ උදව් ලැබෙනවා. වේදිකා පසුතල නිර්මාණය ගාමිණී රණසිංහගේ. ශ්‍රී ලාංකික ගායක ගායිකා වන්ගේ වික්ටෝරියානු සංගමයේ :ඕ* සහයෝගය මම විශේෂයෙන් මතක් කරනවා.

**ශ්‍රීනාත්**
ඔබේ වැඩකටයුතු වලට ගෙදරින් ලැබෙන සහයෝගය කොයි වගේද?

**ශ්‍රියානි**
ඇත්තටම මේ සියල්ල පිටුපස ඉන්නෙ මගේ ආරණීය ස්වාමියා වන ඩෙන්සිල් කතුරුසිංහ හා ශාමිතා ශාලින්ද ධනුජක දේවින්දි යන මගේ දරුවන්. ඔවුන් මා හැමවිටම උනන්දු කරනවා.

උණු කඳුලු වැටේවි ඔබ හඬන්නෙපා
ඇය හඬන්නෙ නෑ සිත සුසුම් නැගේවි
ඔබ තැවෙන්නෙපා
ඇය තැවෙන්නෙ නෑ

ඒ කඳුලු හෙට මිණි මුතු වේවි
ඒ සුසුම මද පවනක් වේවී
සිරිලක දස දෙස මතු බැබලේවි
ලක් මෑණිය ඔබ හෙට හිනැහේවි

අපට හැම කටයුත්කදීම දකින්ට ලැබෙන ශිරෝමි ගේ ප්‍රසංගයේ මෙවන් ගී රැසක් ගැයෙනු ඇත . ඔබත් එදිනට ඇය හා එක්වන්න.




## ඊ මේලයක තිබුණා මෙසේ




සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net







කාලෙකට පස්සෙ අල්ලපු ගෙදර නංගි ආව අපිව බලන්න. ශ්‍රීපාලිට පරණ පුරුද්දට අල්ලපු ගෙදර නංගියි කියල කිව්වට දැන් අපි දෙගොල්ල ඉන්නෙ හැතැප්ම විස්සක් දුරින්. කට්ටිය කුස්සියේ මේසෙ වටේ වාඩි වෙලා බිස්කට්, කිරි ටොෆි කන ගමන් කතාවට වැටුන.

* * *

මං තේ පෝච්චියයි, කෝප්පයි, සීනියි, කිරියි වෙන වෙනම මේසෙට ගෙනිච්ච.

''ටිකක් කරදර වුනත් මේ ක්‍රමේ හොඳයි නේද අක්කෙ?" ඒ ශ්‍රීපාලි.
''ඔව් නංගි, එක එක්කෙනාගෙන් සීනි කොච්චර ඕනෑද කියල අහනවට වැඩිය මෙහෙම සංග්‍රහ කරන එක හොඳයි, තමන්ට අවශ්‍ය ප්‍රමාණයට දාගෙන හදාගෙන බොන්න පුළුවනි."
''අක්කට මතකද මම ඉස්සර කියල තියෙනව අපිට දවසක් තමරලගෙ ගෙදරදි වෙච්ච වැඩක්?"

මට ඒ කතාව මතක් වෙලා හිනාවක් ආපි හදමින් හිටි තේ එකත් ඉහිරෙන තරමට.
''ඒ මොකක්ද ඒ?" අපේ මහත්තය දන්නෙ නැහැ වගෙ ඒ කතාව.

''නැහැ අයියෙ මේකයි. ඔන්න අපි ආපු අළුත, අපි දෙන්න ගියා තමරලගෙ ගෙදර, එවෙලෙම අපේ තව යාළු පවුලකුත් ආව එහෙට. තමර තේ හදන්න ගිහින් අපිට කිව්ව කියන්න එක එක් කෙනාට සීනි ඕනැ කොහොමද කියල. අපේ යාළුව කියපි, තමර මට හැඳි දෙකක් දාන්න, අපේ එක්කෙනාට නම් හැඳි එකක් ඇති, හැබැයි ශ්‍රීපාලිටයි, සිරිටයි නම් හැඳි තුන ගානෙ දාන්න කියල."

''කතාව ඇත්ත, අපි ලංකාවෙන් ආපු අළුත සීනි හැඳි තුන ගානෙ බිව්ව තමයි. අපේ ගෙදර ආපු වෙලාවක අපේ යාළුව ඕක දැකල තියෙනව".
''යාළුවගෙ මහත්තයට ඒ කතාවට හොඳටම ලැජ්ජ හිතුන. අනේ මේ ඔයා ඔයාගෙ සීනි බලාගන්න අනුන්ගෙ සීනි බලන්න යන්න එපා එයා යාළුවට හොඳටෝම සැර කලා."

* * *

''තේ පෝච්චිය පිටින් ගේන එකේ තවත් වැදගත් කමක් තියෙනව නංගි." මං කිව්ව. සමහරු කැමතියි තේ කෝප්ප එකකට වැඩිය බොන්න, විශේෂයෙන්ම එංගලන්තෙ කට්ටිය" මං කිව්වෙ මගෙ ඉංග්‍රීසි ජාතික යාළුව, ඇනට් මතක් වෙලයි.

''ඒකත් ඇත්ත තමයි. අපි හැමදම ආගන්තුක සත්කාරයෙදි, තව කේක් කෑල්ලක්, කෙසෙල් ගෙඩියක්, බිස්කට්ටුවක්, බත් ටිකක් කන්න, තව බීම වීදුරුවක් බොන්න කියල කිව්වට, කවදාවත්ම තව තේකක් බොන්න කියල කියන්නෙ නැහැනෙ?" නිමල් එකඟ වුනා.
''ඒ නම් තේ කෝප්ප වලට හදල ගෙනත් දෙන නිසාම තමයි".
''හැබැයි, අක්කෙ, ඕනැවට වඩා එංගලන්තෙ ක්‍රමයට යන්න එපා. මේ ළඟදි අපි අඳුනන කෙනෙක් එයාගෙ යාළුවෙක් ගැන අපි එක්ක දෙස් කිව්ව, යාළුවගෙ ගෙදර ගිය වෙලේ සංග්‍රහ කලේ සෙලරියි කැරට්යි තීරු කපල, ක්‍රැකර් බිස්කට් සහ චීස් එක්ක ට්‍රොලි එකක ගෙනල්ල කියල". අල්ලපු ගෙදර නංගි කිව්වෙ හරිම සීරියස් විදියට.

''ලංකාවෙ කලේ ජේ.වී.පී. ලු. මෙහේ ඇවිල්ල කළු සුද්දෙක් වෙලාලු. කන්නෙ චීස් එක්ක සෙලරි ලු". සිරි මහ හයියෙන් හිනා වෙන්න පටන් ගත්ත.

* * *

''මං ලංකාවෙදි අහපු හොඳ කතාවක් කියන්නම්". අපේ එක්කෙනා පටන් ගත්ත.

''ඔන්න එක්කෙනේක් ගියාලු යාළුවෙකුගෙ ගෙදර. ටික වෙලාවක් කතා බස් කර කර ඉඳල යන්න නැගිටල මිණිහ ඇහැව්ව ලු මචං මේ ලඟ කඩයක් හෙම නැද්ද කියල".
''ඇයි මොනව ගන්නද කියල යාළුව ඇහැව්වහම කිව්වලු නෑ මේ යන ගමං තේ එකක් බී ගෙන යන්න කියල".

මීට කලින් දහ පාරක් විතර අහල තිබුනත් මට නිමල්ගෙ ඔය කතාවට තවමත් හිනා යනව.

**අල්ලපු ගෙදර අක්කා**

**බෝතලේ කටේ තියාගෙන බියර් බීම. ලබන කලාපයෙන්**